**කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාව - 2022**

**----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාවේ (කොමිෂන් සභාව) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ අන්තර් ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**කරුණක් අවධාරණය කිරීම**

කොමිෂන් සභාව මත ආදායම් බදු පැනවිය හැකිබව පිළිබඳ කොමිෂන් සභාවේ ස්ථාවරය සාකච්ඡා කරනු ලබන මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 2.3.3 කෙරෙහි අවධානය යොමු කරමි. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය විකරණය කරනු නොලැබේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන අන්තර් ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරිම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර

තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව;

- කොමිෂන් සභාව සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව;

- කොමිෂන් සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව;

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 විගණනය සඳහා ලබා නොදුන් ලේඛන සාක්ෂි**

ලිඛිතව දන්වා අවස්ථා කිපයකදී සිහි කැඳවීම් කළද, පහත ලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

| **අයිතමය** | **ගණන රු.** | **ලබා ගත නොහැකි වූ සාක්ෂි** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|
| (අ) ප්‍රජා නීති රීති | අදාළ නැත | පනතේ වගන්ති අංක 3(4) යටතේ සකස් කළ ප්‍රජා නීති රීති ලැයිස්තුව | රැස්වීම් අවස්ථාවලදී අදාළ සියලු තොරතුරු සහ ලේඛන ලබා අප විසින් ලබා දී තිබුණි. | **විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීමට කළමනාකරණය විසින් අවශ්‍ය කටයුතු කළ යුතුය.** |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.18,333,220ක හිඟයක් වූ අතර ඉකුත් වර්ෂයේ මාස හතක (07) කාලය තුළ (2021 මැයි 27 සිට දෙසැම්බර් 31 දක්වා) අනුරූපි අතිරික්තය රු. 8,862,744ක් විය. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.27,195,964ක පරිහානියක් නිරීක්ෂණය විය. පරිහානිය සඳහා හේතුව වූයේ සමාලෝචිත වර්ෂයේ පරිපාලන වියදම් රු. 224,125,512කින් වර්ධනය වීමයි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමයන් ඉකුත් වර්ෂයේ මාස හතක කාලය හා සැසඳීමේ දී වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය පිළිබඳ විශ්ලේෂණය පහත සඳහන් වේ.

| **අයිතමය** | **2022** | **2021 මැයි 27 සිට දෙසැම්බර් 31 දක්වා කාලය** | විචලතාව | **විචලතාව** |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| ලැබෙන සම්පත් | 245,413,217 | 48,771,584 | 196,641,633 | 403% |
| පරිපාලන වියදම් | 262,294,418 | 38,168,906 | 224,125,512 | 587% |
| ප්‍රවර්ධන හා අලෙවි වියදම් | 1,250,637 | 1,582,192 | 331,555 | 21% |
| මූල්‍ය වියදම් | 201,382 | 157,742 | 43,640 | 28% |
| වර්ෂයේ අතිරික්තය / (ඌනතාවය) | (18,333,220) | 8,862,744 | 27,195,964 | 307% |

## 2.3 මූල්‍ය විශ්ලේෂණය

| **විගණන නිරීක්ෂණ** | **කළමනාකරණයේ දැක්වීම** | **අදහස් නිර්දේශය** |
|---|---|---|
| **(අ) කොමිෂන් සභාවේ කාරක ප්‍රාග්ධන කළමනාකරණය** | | |
| 2023 වර්ෂයේ විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රධාන පිරිවැය සංරචක සලකා බැලීමේදී, කොමිෂන් සභාවට අදාළ ස්ථාවර පොදු කාර්ය පිරිවැය වසරකට රුපියල් මිලියන 136ක් පමණ විය. වරාය නගරයේ කටයුතුවල මන්දගාමී ක්‍රියාකාරීත්වය හේතුවෙන් කොමිෂන් සභාවේ ආදායම් උත්පාදනය එහි ව්‍යාපාරික මෙහෙයුම් හරහා සහතික කර නොමැත. එහෙයින්, සාධාරණ මට්ටමකින් සහතික කළ අරමුදල් කොමිෂන් සභාව වෙත ගලා නොයන්නේ නම්, එදිනෙදා මූල්‍ය බැඳීම් සාක්ෂාත් කිරීම ප්‍රශ්නගත විය හැකිය. තවද, කොමිෂන් සභාව විසින් 2023 මාර්තු වන විට ඉතිරි අරමුදල්වලින් කොමිෂන් සභාව පවත්වාගෙන යා හැකි මාස ගණන ගණනය කර ඇති අතර එය ඇස්තමේන්තුගත මාසික වියදම් මුදල වන රු. 12,561,620ක් සමග මාස 8.5ක් ලෙස ගණනය කරන ලදී. කොමිෂන් සභාවේ ප්‍රධාන පිරිවැය සංරචක පහත පරිදි විය.<br><br>ප්‍රධාන පිරිවැය සංරචක — **2023 වසර තුළ දරන ලද පිරිවැය (රු. 000)**<br>ගිණුම් තැබීමේ ගාස්තු — 3,742<br>කාර්යාල කුලී — 27,168<br>වැටුප් වේතන හා පුද්ගලික වියදම් — 105,079<br>මුළු ගණන — 135,989 | කොළඹ වරාය නගරයේ ආයෝජන මන්දගාමී වීමට මූලික වශයෙන් හේතු වී ඇත්තේ රටේ පවතින වාතාවරණයයි. රටේ ස්ථාවරත්වය අඛණ්ඩව පවතින විට දී ව්‍යාපාර ද ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරන අතර එය කොළඹ වරාය නගරයට සෘජු විදේශ ආයෝජන ගලා ඒමට ද හේතු වේ. මීට අමතරව, ආයෝජකයාට ඉතා වැදගත් වන බැංකු රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් අපේක්ෂිත ආයෝජන ගලා ඒම ප්‍රමාද විය. වත්මනේදී ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ එක්ව මෙම රෙගුලාසි සකස් කිරීම අවසන් කර ඇති අතර නුදුරේදීම ප්‍රකාශයට පත් කරනු ලැබේ. සැලසුම් කොට නැවතී ඇති ඇතැම් ආයෝජන මෙමගින් ආරම්භ කළ යුතුය. මීට අමතරව, කටයුතු කරගෙන යාම සඳහා වූ අරමුදල් අවශ්‍යතා සපුරාලීමට | **එදිනෙදා මූල්‍ය වගකීම් සපුරා ගැනීම සඳහා ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධනය ඇති බවට කළමනාකරණය සහතික විය යුතුය.** |

කොමිෂන් සභාව විසින් ව්‍යාපෘති සමාගමෙන් රුපියල් මිලියන 200 ක පොලී රහිත අත්තිකාරමක් ලබාගෙන ඇති අතර, ගාස්තු වැඩිවීමක් සහිත සංශෝධිත ගාස්තු නියාමනය ඉදිරි සති දෙක තුළ ප්‍රකාශයට පත් කෙරේ. එමගින් ප්‍රමාණවත් අරමුදල් ගලා ඒම් අපේක්ෂා කරනු ලැබේ.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 විවේක හා විනෝදාශ්වාද ක්‍රියාකාරකම් සඳහා නිකුත් කළ තාවකාලික බලපත්‍ර

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ.) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනතේ (පනත) 65 (1) වගන්තියට අනුව, පනතේ ආරම්භක දිනයේ සිට කොළඹ වරාය නගරය ප්‍රදේශයට අයත් සියලුම ඉඩම් කොමිෂන් සභාව වෙත පවරනු ලැබිය යුතුය. එහෙයින්, මෙම ප්‍රදේශයට අයත් ඕනෑම ඉඩමක් යම් කාර්යයක් සඳහා භාවිත කළ යුත්තේ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් කොළඹ වරාය නගරය ආර්ථික කොමිසමේ එකඟතාවය ඇතිවය. කෙසේ වෙතත්, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ ("කොමිෂන් සභාව") එකඟතාවයකින් තොරව කොළඹ වරාය නගරය ආශ්‍රිත ප්‍රදේශය තුළ වසර පහක (05) කාලයක් සඳහා විවේක හා විනෝදාස්වාද කටයුතු සිදු කිරීමට ව්‍යාපෘති සමාගම (චයිනා හාබර් සහ ඉංජිනේරු සමාගම - CHEC) විසින් තාවකාලික බලපත්‍ර එකොළහක් (11) නිකුත් කර තිබුන බව නිරීක්ෂණය විය.<br><br>**(ආ.) පනත බලාත්මක කිරීමෙන් පසු බලපත්‍ර නවයක් (09) නිකුත් කර ඇති බව නිරීක්ෂණය වූ අතර, එම ව්‍යාපාර සියල්ල පනතේ විධිවිධානවලට අනුකූලව ශ්‍රී ලංකා රජය යටතේ පාලනය විය යුතු වෙරළ, උද්‍යානය තුළ පිහිටා ඇත. කෙසේ වෙතත්, එම බලපත්‍ර නිකුත් කිරීමෙන් උපයන ආදායම ව්‍යාපෘති සමාගම පමණක් භුක්ති විඳ ඇති බවත් ශ්‍රී ලංකා රජයට කිසිදු ආදායම් ප්‍රතිලාභයක් ලබා දී නොමැති බවත් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, එවැනි ව්‍යාපාරවලින් ලැබෙන මූල්‍ය ප්‍රතිලාභය ත්‍රෛපාර්ශ්වික ගිවිසුම මගින් හෝ පනතේ විධිවිධාන මගින් ව්‍යාපෘති සමාගමට ලබා දී නොතිබුණි. ලිඛිත ඉල්ලීම් හා ලිඛිත සිහි කැඳවීම් කිහිපයක් සිදු කර තිබියදීත්, තවද, එම බලපත්‍ර නිකුත් කිරීමෙන් ව්‍යාපෘති සමාගම විසින් උපයා ගන්නා ලද ආදායම පිළිබඳ විස්තර විගණනය සඳහා ලබා දී තිබුනේ නැත.** | මේ කරුණ පාර්ලිමේන්තුවේ අවස්ථා ගණනාවකදී සාකච්ඡා කෙරුණි. ඔබේ කණ්ඩායමට සියලුම ලේඛන ලබා දුනි. කෙසේ වෙතත්, ක්‍රියාකරුවන්ට තම කොන්ත්‍රාත්තු කාලය අවසන් වන තුරු මෙහෙයුම් සිදු කිරීමට අවසර තිබෙන බව දැනට පවතින ස්ථාවරය වේ. නීතිපති කාර්යාලය සහ අමාත්‍යාංශය විසින් ප්‍රතිචාර ලබා දී ඇති අතර රාජ්‍ය මුදල් පිළිබඳ කාරක සභාවේ ලේකම්වරයා සමඟ පසුව කරන ලද ලිපි ගණුදෙනු ඇමුණුම V හි දක්වා ඇත. | **කොමිෂන් සභාව පනතේ සඳහන් වගන්තියට අනුගතව කටයුතු කළ යුතුය.** |

(ඈ.) 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනතේ 26(1) වගන්තියට අනුව, මෙම පනතට අනුව බලය පැවරූ පුද්ගලයෙකුට හැර වෙනත් අයෙකුට කොළඹ වරාය නගර බල ප්‍රදේශයේ හා ඒ අවට ව්‍යාපාරවල නිරත වීමට අවසර ලබා නොදේ. එබැවින්, පනත යටතේ බලයලත් පුද්ගලයන් වශයෙන් ලියාපදිංචි නොවී එම බලපත්‍ර නිකුත් කර ඇති බැවින් තාවකාලික බලපත්‍ර නිකුත් කිරීම පනතේ විධිවිධානවලට පටහැනි බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුළ සමාගම් සඳහා තාවකාලික බලපත්‍ර 11ක් නිකුත් කර ඇත.

### 3.2 ප්‍රවර්ධන ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇ) කොළඹ වරාය නගරයේ ප්‍රධාන සැලැස්මට අනුව, රටට ආර්ථික ප්‍රතිලාභ ගෙන ඒම සඳහා අලෙවි කළ යුතු විකිණිය හැකි හෙක්ටයාර 62.1ක ඉඩම් කොටසක් ශ්‍රී ලංකා රජය සඳහා ලබා දී තිබුණි. අලෙවි කළ හැකි අනෙක් හෙක්ටයාර 116.2ක ඉඩම් කොටස බදු දීමට චීන වරාය හා ඉංජිනේරු සමාගමට (China Harbor and Engineering Company - CHEC) හිමිකම ඇත. තවද, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව (Colombo Port City Economic Commission) හා සසඳන විට CHEC හට අලෙවිකරණ උපාය මාර්ගයක් තිබුන බව නිරීක්ෂණය විය. එබැවින්, අලෙවි කළ හැකි ඉඩම බදු දීම සම්බන්ධයෙන් කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව සහ CHEC වරාය නගරය අතර අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ සැලැස්මක් තිබුනේ නම්, බොහෝ විට දෙපාර්ශවයටම වඩාත් ප්‍රතිලාභ අත්විය හැකිව තිබූ බව නිරීක්ෂණය විය. එබැවින්, ආයෝජකයින් සොයා ගැනීම පිළිබඳ ඒකාබද්ධ ප්‍රයත්නයක් ශ්‍රී ලංකාව සඳහා වඩාත් කාර්යක්ෂම සහ වාසිදායක වනු ඇත. එවැනි ක්‍රියාමාර්ගයක් මගින් අලෙවි කළ හැකි ඉඩම් අලෙවි කිරීම හා සම්බන්ධ අවදානම් අවම කර ගැනීමට හැකි වන බව ද නිරීක්ෂණය කර තිබුණි. | මෙය මනාව සැලකිල්ලට ගත් අතර, ඒකාබද්ධ අලෙවිකරණයක වැදගත්කම පිළිබඳ කොමිෂන් සභාව දැනුවත් ය. කෙසේ වෙතත්, අලෙවි කළ හැකි රජයේ ඉඩම්වල තිබෙන පාසල්, විශ්වවිද්‍යාල, රෝහල් වැනි සමාජ යටිතල පහසුකම් ව්‍යාපෘති 10ක් හැරුණු විට, අලෙවි කළ හැකි රජයේ ඉඩමකින් මුදල් ඉපැයීමට පෙර අලෙවි කළ හැකි CHEC ඉඩම් 6කින් මුදල් ඉපයිය හැකි බවට පැහැදිලි අවබෝධයක් ඇත. මේ අනුව, අලෙවි කළ හැකි රජයේ ඉඩම්වලින් මුදල් ඉපයීමේ හැකියාව මෙම විධිවිධානයට යටත් වේ. | **ශ්‍රී ලංකා රජයේ භාවිතයට ගත හැකි අලෙවි කිරීමේ හැකියාවකින් යුත් ඉඩම් කොටස අලෙවි කිරීම සඳහා ඒකාබද්ධ ප්‍රයත්නයක් කෙරෙහි කොමිසම අවධානය යොමු කළ යුතුය.** |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

### 3.3.1 කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් පත් කිරීම

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනතේ 24(4) වගන්තියට අනුව කොමිසමේ සියලුම කටයුතු සඳහා අධ්‍යක්ෂ ජනරාල් (DG) වගකිව යුතුය. තවද, පනතේ 25(ආ) වගන්තියට අනුව, කොමිසමේ කටයුතු දෛනිකව කළමනාකරණය සහ පරිපාලනය කිරීම අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු කළ යුතුය. කෙසේ වෙතත්, කොමිසමේ ආරම්භයේ පටන් කළමනාකරණය සහ පරිපාලනය මෙහෙයවීම සඳහා ස්ථිර පදනම මත අධ්‍යක්ෂ ජනරාල් පත් කර නොතිබූ බව නිරීක්ෂණය විය. ඒ වෙනුවට දිගින් දිගටම අර්ධකාලීන පදනමින් රාජකාරි ආවරණ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් කොමිසමේ සාමාජිකයකු පත් කර තිබුණි. කොමිෂන් සභාව ආරම්භයේ පටන් කොමිෂන් සභාවේ සාමාජිකයින් 03 දෙනෙකු කොමිසමේ වැඩබලන අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් කටයුතු කරන ලදී. එබැවින්, පනතට අනුව අධ්‍යක්ෂ ජනරාල්ගේ වගකීම් ඵලදායී ලෙස ඉටු කළ නොහැකි විය. | කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනතේ විස්තර කර ඇති පරිදි අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙනුවෙන් කටයුතු කරන පුද්ගලයා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ භූමිකාව භාර ගනු ලැබේ. එම තරාතිරම තුළ කටයුතු කරන පුද්ගලයා කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනතට අනුව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබේ. එවැනි බඳවා ගැනීම් අධික ලෙස මුදල් වැය වන යෝජනාවක් බැවින්, නියමයන් හා සියලු අනුයාත කරුණු ක්‍රියාත්මකව පවතින විට, එවැනි විශේෂ ආර්ථික කලාප කළමනාකරණය කිරීමේ අදාළ පළපුරුද්ද සහිත ස්ථිර අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු බඳවා ගැනීමට කොමිෂන් සභාව විසින් සැලසුම් කරනු ලබයි. | **කළමනාකරණය සහ පරිපාලනය ඵලදායී ලෙස පවත්වාගෙන යාම පිණිස අධ්‍යක්ෂ ජනරාල් තනතුර ස්ථිර පදනමින් පත් කළ යුතුය.** |

### 3.3.2 පුරප්පාඩු තනතුරු

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණනයට ඉදිරිපත් කරන ලද සංවිධාන ව්‍යුහයට අනුව, 2024 ජනවාරි 09ක් වූ විගණන දිනට අධ්‍යක්ෂ තාක්ෂණ හා පරිවර්තන මෙන්ම කළමණාකාර - මානව සම්පත් යන තනතුරු පුරප්පාඩු වී තිබුණි. | අවශ්‍ය වූ විට බඳවා ගැනීම් සිදු කිරීමට කොමිසම සැලසුම් කර ඇත. | **පුරප්පාඩු වී ඇති තනතුරු හැකි ඉක්මනින් පිරවිය යුතුය.** |

## 3.4 සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීමේ ඵලදායිත්වය

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආර්ථිකයට ධනාත්මක බලපෑමක් ඇති කරන තාක්‍ෂණය, දැනුම, නවෝත්පාදන සහ රැකියා ආදිය ගෙන ඒම තුළින් සෘජු විදේශ ආයෝජන මගින් බොහෝ විට ආර්ථික වර්ධනයට සෘජු බලපෑමක් ඇති කරයි. කෙසේ වෙතත්, සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා කොළඹ වරාය නගරය මුහුණ දී ඇති අවදානම් සහ අභියෝග, එම අභියෝග ජය ගැනීම සඳහා වූ අවම කිරීමේ උපාය මාර්ග සහ එම අභියෝග ජය ගැනීම උදෙසා අදාළ බලධාරීන් සමඟ කරන ලද ඵලදායී සංවාද හඳුනා ගැනීම සඳහා සිදු කරන ලද අධ්‍යයනයක් ලබා දී නොමැත. | ඉල්ලා සිටින මෙම වාර්තාව පිළිබඳ කිසිදු සටහනක් අප සතුව නොමැත. කෙසේ වෙතත්, කාර්යාලයේ ගත කළ කාලය තුළ වෙළඳපල උපාය මාර්ගය පිළිබඳව සාකච්ඡා කරන ලද අතර මතු වූ සියලු ගැටළු සඳහා විසඳුම් ලබා දුනි. පවතින ආර්ථික වාතාවරණය හා පැහැදිලි කිරීම් අවශ්‍ය කරන විවිධ රෙගුලාසි හේතුවෙන් ආයෝජකයින් කොළඹ වරාය නගරයේ ආයෝජනය කිරීමට අදිමදි කරමින් සිටින බව මෙහිදී පැහැදිලි විය. | **සෘජු විදේශ ආයෝජන පිළිබඳ සීමාවන් සහ අභියෝග පිළිබඳව කොමිෂන් සභාවට මනා අවබෝධයක් තිබිය යුතුය.** |

## 3.5 පාරිසරික ගැටලු

### 3.5.1 බේරේ වැව අවහිර වීමේ පාරිසරික බලපෑම

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ත්‍රෛපාර්ශ්වික ගිවිසුමේ උපලේඛන 03 හි 3.6 වගන්තියට අනුව බේරේ වැව පිටාර ගැලීමේ බාධාව ඇති විය හැකිය. කෙසේ වෙතත්, ජලය එකතැන පල්වීමේ පාරිසරික බලපෑම් සඳහා විසඳුම් ගිවිසුම හරහා සාකච්ඡා කර නොමැත. එබැවින්, අතිරේක අපජලය හේතු කොට බේරේ වැව පිටාර ගැලීමෙන් දුර්ගන්ධයක් නිකුත් වන බව දැකගත හැකි විය. අමාත්‍යාංශයේ ව්‍යාපෘති නියාමන ඒකකයේ ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද 2023 අගෝස්තු 11 දිනැති ලිපියට අනුව, ත්‍රෛපාර්ශ්වික ගිවිසුමට අනුව යටවූ බැම් සැලසුම් කිරීම සහ ඉදිකිරීම ව්‍යාපෘති සමාගමේ වගකීම බැවින් පුළුල් විශ්ලේෂණයක් සිදු කර සුදුසු ඉංජිනේරු විසඳුමක් ලබා දෙන ලෙස ව්‍යාපෘති සමාගමෙන් ඉල්ලා තිබුණි. කෙසේ වෙතත්, මේ සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොමැති බව නිරීක්ෂණය වූ අතර බේරේ වැව පිටාර | 3 වන උපලේඛනයේ 3.6 වගන්තියේ සඳහන් ජලයෙන් යට වූ බැම්, ඉදිරියේදී ඇති වීමට ඉඩ ඇති බේරේ වැව පිටාර ගැලීම සඳහා ඇති එකම විසඳුම නොවේ. එය නිම කිරීම සඳහා පුළුල් අධ්‍යයනයක් අවශ්‍ය වේ. මීට අමතරව, වඩාත්ම සුදුසු ව්‍යුහය කුමක්ද යන්න තීරණය කිරීම සඳහා වරාය නගර ඇළ විවෘත කිරීමෙන් පසු ජල තරංග රටාව ද අධ්‍යයනය කළ යුතුය. මෙම යටිතල පහසුකම් සංවර්ධන කටයුතු ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ විෂය පථයට අයත් වේ. එමගින් ඔබට වැඩිදුර පැහැදිලි කිරීම් ලබා ගත හැකිය.<br>තවද මෙම දුගඳ පිළිබඳ ගැටලුව බේරේ වැවේ ජලය නිසා හට ගන්නක් නොව චෛත්‍ය පාරට සමාන්තරව ඇති වැසි ජල | **අප ජල කළමනාකරණය හා පාරිසරික ගැටලු සඳහා හැකි ඉක්මණින් විසඳුම් සෙවිය යුතුය.** |

ගැලීමෙන් දුගඳ හමන බව 2024 ජනවාරි 09ක් වූ විගණන දිනය දක්වා නිරීක්ෂණය විය.

මාර්ගයෙන් පිටවන අමු අපද්‍රව්‍ය නිසා ඇතිවන්නක් බව අනාවරණය විය. මෙම කාරණාව පිළිබඳව ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානීගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති කාර්යාලයේ සාකච්ඡාවට ලක් කෙරුණ අතර එහිදී රාජ්‍ය ආයතන දෙකක් තම අපජලය ඉහත කී වැසි ජල මාර්ගයට සෘජුවම සම්බන්ධ කර ඇති බවට හඳුනාගන්නා ලදී.

එබැවින්, වැසි ජල මාර්ගයට සම්බන්ධ කර ඇති මෙම නීති විරෝධී අපජල මාර්ගවලට පිළියම් යෙදීම කොළඹ මහ නගර සභාවේ වගකීමකි.